ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2383/07 – 2024 මැයි මස 06 වැනි සඳුදා – 2024.05.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/22/02/2014.

### කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.07.29 දිනැති හා අංක 2342/56 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.07.24 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් දඹදෙනිය, වැත්තැව, වැත්තැව පාසල ඉදිරිපිට පදිංචි ඩී. එස්. එම්. විජේසිංහ මයා සහ මහනුවර, යටිනුවර වීදිය, අංක 106 හි පිහිටි කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A52/2023 හා 2023.04.01 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 අප්‍රේල් මස 18 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 041881 – 11 (2024/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

නඩු අංකය - A/52/223.
ගොනු අංකය - IR/22/02/2014.

ඩී. එස්. එම්. විජේසිංහ මයා
වැත්තෑව පාසල ඉදිරිපිට
වැත්තෑව,
දඹදෙනිය.

*පළමු පාර්ශ්වය*

කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆයිනෑන්ස් පී.එල්.සී.
අංක 106,
යටිනුවර වීදිය,
මහනුවර.

*දෙවන පාර්ශ්වය*

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින ආරාවුල සම්බන්ධයෙන් ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය ප්‍රකාරව තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එම ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කටුගස්තොට, ගුහාගොඩ පාර, අංක 85/C හි පදිංචි ඩබ්. එම්. එස්. ඩී. වීරකෝන් වන මා පත්කොට ඇත.

**බේරුම් කළයුතු කරුණු**

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

"කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි සේවය කළ ඩී. එස්. එම්. විජේසිංහ නමැති සේවක මහතාට 2012.04.01 දින සිට 2013.03.31 දින දක්වා සහ 2013.04.01 දින සිට 2014.03.31 දින දක්වා කාලයන්ට අදාළ වාර්ෂික වැටුප් වර්ධක, ප්‍රසාද දීමනා හා ලාබ කොටස් තමාට ලබා නොදීමෙන් අසාධාරණයක් වූ බවට ඔහු විසින් කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත වන්නේ ද යන්න සහ එලෙස යුක්ති සහගත වන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ."

2023.08.21, 2023.09.27, 2023.11.10 යන දිනයන් හිදී මහනුවර ක්වාසි අධිකරණයේදී මෙම ආරාවුල විභාගකොට ඇත. එහිදී පළමු පාර්ශ්වයේ නීතීඥ මහතා විසින් 2023.10.10 වන දින ගොනුකරන ලද ලේඛනය මගින් දක්වා ඇත්තේ දෙවන පාර්ශ්වය වෙතින් රු. ලක්ෂ පහක (රු. 500,000) මුදලක් ලබාගෙන ආරාවුල සමථයකට පත්කර ගැනීමට කැමැත්ත පළ කර ඇති බවත්ය. ඒ අනුව 2023.11.08 දාතම මහනුවර හැටන් නැෂනල් බැංකු ශාඛාවේ අංක 522369 දරන චෙක්පත මගින් එකී සමථ මුදල දෙවන පාර්ශ්වය වන කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. විසින් පළමු පාර්ශ්වය වෙත 2023.11.10 දින භාරදී ඇත. ඒ බව 2023.11.10 වන දින කාර්ය සටහන් මගින් තහවුරු කර ඇත.

මෙය අවසාන සමථයක් වන අතර මින් ඉදිරියට පළමු පාර්ශ්වය හට අදාළ සමාගමේ සේවකයකු ලෙස හෝ සේවයේ යෙදී සිටි සේවකයකු ලෙස කිසිදු අයිතිවාසිකමක් හෝ කිසිදු ඉල්ලීමක් සිදුකිරීමට ඉඩක් නොමැති බවට නියම කරමි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව ප්‍රකාශ කරමි.

**ඩබ්. එම්. එස්. ඩී. වීරකෝන්,**
බේරුම්කරු.

2023 අප්‍රේල් මස 01 වැනි දින දී ය.

EOG 05 – 0036

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.